19. හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදනය පිළිබඳ නිර්වචනයට අනුව සන්නිවේදන ක්‍රියාවලියේ අවසාන ඉලක්කය වන්නේ,
(1) ප්‍රබල නාලිකා භාවිතයයි.
(2) අපේක්ෂිත බලපෑම ඇති කිරීමයි.
(3) සන්නිවේදකයාගේ කුසලතාව වර්ධනය කරගැනීමයි.
(4) ග්‍රාහක අත්දැකීම් පසුතලයට ගැලපෙන සන්දේශයක් ඉදිරිපත් කිරීමයි.


20. විවිධ මාධ්‍ය කෙරෙහි එකට එකතු වීම දැකිය හැකි වන්නේ,
(1) අභිසාරිතාවේ දී ය.
(2) ජනසන්නිවේදනයේ දී ය.
(3) විමධ්‍යගතකරණයේ දී ය.
(4) අන්තර් සන්නිවේදනයේ දී ය.

21. මාධ්‍යයක් ඇතිවීමේ ප්‍රධාන පියවර තුන වන්නේ පිළිවෙළින්
(1) නිපැයුම, භාවිත කිරීම හා ආයතනීකරණයයි.
(2) ආයතනීකරණය, නිපැයුම හා භාවිත කිරීමයි.
(3) භාවිත කිරීම, ආයතනීකරණය හා නිපැයුමයි.
(4) භාවිත කිරීම, නිපැයුම හා ආයතනීකරණයයි.

22. පහත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරන්න.
A : ඇස්ටා විශ්වර්ත මුල් කාලීන වංශලේඛන පුවත්පතකි.
B : ලක්මිණි පහන ලංකාවේ ප්‍රථම සිංහල පුවත්පතයි.
C : මාසික නැගීම ක්‍රිස්තියානි සමිතියක් සහිත සඟරාවකි.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) A පමණක් නිවැරදි ය.
(2) B පමණක් නිවැරදි ය.
(3) C පමණක් නිවැරදි ය.
(4) B හා C පමණක් නිවැරදි ය.

23. නිදහස් මාධ්‍යවේදියකු ලෙස හඳුන්වනු ලබන්නේ,
(1) පත්තරයේ ම මාධ්‍ය ආයතනයක් පවත්වාගෙන යන්නකු ය.
(2) විවිධ ආයතනවලට කොන්ත්‍රාත් පදනම මාධ්‍යවේදියකු ය.
(3) ආයතනයක් තුළ නිදහස උපරිමයෙන් භාවිත කරන මාධ්‍යවේදියකු ය.
(4) ආයතනයකට සම්බන්ධ වී කොන්ත්‍රාත් පදනමකින් සේවය කරන මාධ්‍යවේදියකු ය.

24. මෙම රූපයෙන් දැක්වෙන්නේ,



(1) ශ්වේත ක්‍රියාකාරී පුවරුවකි.
(2) ෆ්ලිප් චාට්.
(3) පිටු පෙරළනයකි.
(4) ධ්වනි පුවරුවකි.

25. බුද්ධිමය දේපළ පනතට අනුව සිනමා නිර්මාණ අයිතිය විකිණීම, බෙදාහැරීම ආදිය නිර්මාණකරුට හිමි අයිතිය වන්නේ,
(1) සදාචාරාත්මක අයිතිවාසිකමකි.
(2) නිර්මාණාත්මක අයිතිවාසිකමකි.
(3) ආර්ථික අයිතිවාසිකමකි.
(4) [illegible] අයිතිවාසිකමකි.

26. නිශ්චල ඡායාරූපයක් යනු,
(1) දර්ශනයක් රූ ගත කිරීමකි.
(2) දර්ශනයක් සටහන් කර ගැනීමකි.
(3) දර්ශනයක් ප්‍රතිනිර්මාණය කිරීමකි.
(4) දර්ශනයක එක් නිමේෂයක් සටහන් කර ගැනීමකි.

27. නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) සන්දේශය හරිහැටි ග්‍රාහකය කර ගත නොහැකි වීම ශබ්ද බාධාවකි.
(2) සන්දේශයක යටි පෙළ තේරුම් ගත නොහැකි වීම මාධ්‍ය බාධාවකි.
(3) සන්දේශයක අන්තර්ගත අර්ථ නොදත මාධ්‍ය බාධාවලට හේතු වේ.
(4) සන්දේශයක භාවිත කර ඇති සංකේත අර්ථවත් කර ගැනීමේ නොහැකියාව අර්ථ ගත මාධ්‍ය බාධාවලට හේතු වේ.

